CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# බුර්කා සහ මද්‍රාසා තහනම් කිරීමේ යෝජනාව ගැන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශය

***2021 මාර්තු 18, කොළඹ, ශ්‍රී ලංකාව:*** බුර්කාව ඇඳීම තහනම් කිරීමට සහ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූල නොවන මද්‍රාසා තහනම් කිරීමට ආණ්ඩුව පියවර ගනිමින් සිටින බවට මහජන ආරක්ෂක අමාත්‍ය පර්ලිමෙන්තු  මන්ත්‍රී සරත් වීරසේකර මහතා කළ ප්‍රසිද්ධ ප්‍රකාශය සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අවධානය යොමු වෙයි. මෙම ප්‍රතිපත්තියට හේතු වුයේ ජාතික ආරක්ෂාව සහතික කිරීම බව ඇමතිවරයා ප්‍රකාශ කොට තිබේ. ආණ්ඩුවේ ප්‍රතිපත්තිය නියෝජනය කරන ඇමතිවරයාගේ ප්‍රකාශය මගින් පිළිතුරුවලට වඩා ප්‍රශ්න මතුකරන බව විශ්වාස කරන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අදහස වන්නේ බුර්කාව සහ මද්‍රාසා සම්බන්ධයෙන් ප්‍රතිපත්ති තීරණ ගත යුතු වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ සිවිල් සහ දේශපාලන අයිතීන් පිලිබඳ ජාත්‍යන්තර සම්මුතියෙන් (ICCPR)  සහතික කොට ඇති අයිතීන් පිළිබිඹු වන ආකාරයට බවයි.

ජාතික ආරක්ෂාව සහතික කිරීම ආණ්ඩුවක ප්‍රධාන වගකීමක් බවත්, එය ජාතික සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ මූලික අයිතීන් සීමා කිරීමට නීත්‍යනුකූල හේතුවක් වන බවත්, අපි පිළිගනිමු. එසේ වුව ද, අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහ සිවිල් සහ දේශපාලන අයිතීන් පිලිබඳ ජාත්‍යන්තර සම්මුතිය යටතේ ඇති විධිවිධාන අනුව ජාතික ආරක්ෂාවේ අවශ්‍යතා නීත්‍යානුකූල ලෙස ක්‍රියාවට නැගීම සඳහා මූලික අයිතිවාසිකම් සීමාකිරීමේ ඕනෑ ම පියවරක් ගත යුතු වන්නේ නීතියේ සඳහන් කොට ඇති ආකාරයට සහ එමගින් වළකා ගැනීමට යන හානිය සමග සැසඳීමේ දී සමානුපාතික වන ආකාරයෙනි

තහනම නීතිමය වශයෙන් ක්‍රියාත්මක කරන්නේ කුමන නීතිමය ප්‍රතිපාදන යටතේ ද යන්න ඇමතිවරයාගේ ප්‍රකාශය පිලිබඳ වාර්තාවල සඳහන් වන්නේ නැත. කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිත කැබිනට් පත්‍රිකා කෙටුම් පතකට ඇමතිවරයා අත්සන් තැබූ පමණින් හෝ එබඳු පත්‍රිකාවකට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වූ පමණින් එය මූලික අයිතීන්ට සීමා පැනවිය හැකි නීතියක් වන්නේ නැත.

සිවිල් සහ දේශාපාලන අයිතීන් පිලිබඳ සම්මුතියේ ගිවිසුම් නිරීක්ෂණ අංශය වන මානව හිමිකම් කමිටුව 2018 දී ලබාදුන් ප්‍රධාන තීන්දු දෙකක් මගින් (යෝකර් එරෙහිව ප්‍රංශය සහ හෙබාජි එරෙහිව ප්‍රංශය) තීරණය කොට ඇත්තේ මුස්ලිම්වරුන්ගේ ඇඳුම් පොදු වශයෙන් තහනම් කිරීම, සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ සම්මුතියෙන් ලබා දී ඇති ආරක්ෂක ප්‍රමිතීන් සමඟ අනුකූල නොවන බව යි. මෙම සිද්ධි පිළිබඳව, මානව හිමිකම් පිලිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ සාරාංශ වාර්තාවේ පහත උපුටනය මගින් ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රශ්නවලට අදාළ තත්ත්වය පැහැදිලි වෙයි.

"ප්‍රසිද්ධ ස්ථානවල නිකාබ් ඇඳුම ඇඳ සිටීම පොදු අපරාධයක් ලෙස තහනම් කිරීමට ප්‍රංශය හඳුන්වා දී ඇති නීතිය මගින් තමන්ගේ ආගමික ඇදහීම පෙන්නුම් කිරීමට පෙත්සම්කරුවන්ගේ ඇති අයිතියට අසාධාරණ ලෙස හානිකර බවත්, මෙම ඇඳුම තහනම් කිරීමේ අවශ්‍යතාවය ප්‍රංශය විසින් ප්‍රමාණවත් ලෙස පැහැදිලි නොකළ බවත් කමිටුව නිගමනය කරයි. විශේෂයෙන් ම, ආරක්ෂක ස්ථාවරයකින් හෝ සමාජයේ "එකට ජීවත්වීමේ" අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා හෝ මුහුණු වැසීමේ තහනම අවශ්‍ය සහ සාධාරණ බවට ප්‍රංශය කළ ප්‍රකාශ කමිටුවට පිළිගත නොහැකි ය. විශේෂ තත්ත්වයන් යටතේ හඳුනාගැනීමේ අවශ්‍යතා සඳහා පුද්ගලයින් මුහුණු පෙන්වීම රජයකට අවශ්‍ය විය හැකි බව කමිටුව පිළිගන්නා නමුත්, නිකාබය පොදු වශයෙන් තහනම් කිරීම එම අවශ්‍යතාවය විශාල ලෙස ඉක්මවා යාමක් ලෙස සලකයි. සම්පූර්ණ ඇඳුමින් සැරසුණු කාන්තාවන් ආරක්ෂා කරනවා වෙනුවට, තහනම් කිරීම මගින්, බලාපොරොත්තු වූ දෙයට ප්‍රතිවිරුද්ධ දෙය සිදුවෙමින් ඔවුන් තම නිවෙස්වලට සීමා වීමත්, එමගින් ඔවුන් මහජන සේවා වෙත ප්‍රවේශ වීම සීමා වීමත් සහ ඔවුන් ආන්තීකකරණයට ලක්වීමත් සිදුවිය හැකි බව ද කමිටුව නිගමනය කරයි. "

මෙයින් පෙනී යන්නේ ඇමතිවරයා විසින් ප්‍රකාශ කොට ඇති ආකාරයේ බුර්කා සම්බන්ධ ප්‍රතිපත්තිය මගින් සිවිල් සහ දේශපාලන අයිතීන් පිලිබඳ ජාත්‍යන්තර සම්මුතියෙන් ශ්‍රී ලංකාව බැඳී සිටින ගිවිසුම් බැලූ බැල්මට බිඳ වැටෙන බව යි. වඩාත් නිශ්චිත වූ ප්‍රතිපත්තියකින් තොරව, ආගමික ප්‍රජාවකට එරෙහිව අසාධාරණයන් සිදුවන ආකාරයෙන් නීතිමය ආවරණයක් ලෙස ජාතික ආරක්ෂාව යන්න භාවිතා කළ නොහැකි ය. එමෙන් ම, කොවිඩ් 19 වෛරසයෙන් ආරක්ෂා වීම සඳහා ආරක්ෂිත පියවරක් ලෙස මුහුණු ආවරණය සම්බන්ධයෙන් පවතින නිල අවශ්‍යතාවය, බුර්කාව තහනම් කිරීමට එරෙහිව ක්‍රියාත්මක වන ආකාරය ද පැහැදිලි නැත. ආගමික අසාධාරණයට සහ සමානාත්මතාවයට ඇති මූලික අයිතියට අමතරව මෙමගින් නෛතික විකාරරූපීබවක් ප්‍රකාශ වීම සිදුවනු ඇත.

මද්‍රාසා සම්බන්ධයෙන් ගත් කළ, මද්‍රාසා මගින් ආගමික අධ්‍යාපනයට ඉඩ දෙන අතර ම ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය මගින් ස්ථාපිත නියාමන රාමුවක් තුළ එය සිදු කිරීමේ දී ඇතිවන එකිනෙක ගැටෙන සලකාබැලීම් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හඳුනා ගනියි. කෙසේ වෙතත්, මද්‍රාසා සම්බන්ධයෙන් ඇතුළුව අධ්‍යාපන ප්‍රතිපත්ති ගැන වඩා හොඳින් කටයුතු කළ හැක්කේ ජාතික ආරක්ෂාව ගැන වගකියන අමාත්‍යාංශ සහ ආයතනවලට නොව අධ්‍යාපන අමාත්‍යාංශයට ය. ජාතික ආරක්ෂක අවශ්‍යතා පවතින ප්‍රමාණයට අනුව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියේ සාමාන්‍ය සම්මතයන්ට අමතරව විශේෂ ව්‍යතිරේඛ පිළිගත හැකි අතර එසේ කළ හැකි වන්නේ එකී අරමුණුවලට අවශ්‍ය සහ සමානුපාත ප්‍රමාණයට ය. අධ්‍යාපන ප්‍රතිපත්තියේ තීරකයින් බවට ජාතික ආරක්ෂක ආයතන පත් කරන හෝ පත් කිරීමට ඉඩ ඇති ඕනෑ ම ප්‍රතිපත්තියක්, නිදහස සහ විවිධත්වය එහි ආරක්ෂාව තරම් ම වැදගත් කොට සලකන ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට ගැලපෙන්නේ නැත. විශේෂයෙන් ම අප අවධාරණය කරන්නේ ඉස්ලාමීය ඉගැන්වීම් අර්ථ දැක්වීමට වැනි විශේෂ දැනුමක් අවශ්‍ය කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමට ආරක්ෂක හෝ මහජන ආරක්ෂක හෝ අමාත්‍යාංශවල තීරණ ගන්නා උදවිය සුදුසු බලධාරීන් නොවන බව යි.

බුර්කා සහ මද්‍රාසා තහනම් කිරීම, සීමා කිරීම හෝ පාලනය කිරීම හෝ වටා ඇති ප්‍රශ්න සංකීර්ණ බවත්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ ඒවා පිළිබඳව සාධාරණ ලෙස විසම්මුතීන් පවතියහැකි වන බවත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වැඩි දුරටත් පෙන්වා දෙයි. ශ්‍රී ලංකාව තුළ එබඳු විසම්මුතීන් හා විවාද සමස්ත සමාජය තුළ තරම් ම, මුස්ලිම් ප්‍රජාව තුළ ද පවතියි. දිගු කාලීන ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ලෙස, මෙබඳු මතභේද

ආරක්ෂාව සහ නිදහස යන දෙක ම ආරක්ෂාවන ආකාරයෙන්, දේශපාලන ආයතන සහ සිවිල් සමාජය තුළින්, සාමකාමීව සහ ගෞරවනීය ලෙස මෙහෙයවා ගැනීමට  අපට හැකියාව තිබිය යුතු ය.

මේ සියලු ම එකිනෙක ගැටෙන ප්‍රජාතන්ත්‍රවාදී සලකා බැලීම් සඳහා නිසි සැලකිල්ලක් දක්වන ප්‍රතිපත්තියක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අයිතීන් සහ ජාත්‍යන්තර නීතිය සමග අනුකූල වනු ඇති අතර අපගේ බහුත්ව සමාජයේ අදාළ සියලු අවශ්‍යතා සමග හැකි උපරිම සාකච්ඡාවක් මත පදනම් විය යුතු ය. බහුවිධ අභියෝගයන්ට මුහුණ දීමේ පළමු හෝ එකම හෝ ප්‍රතිචාරය ලෙස  ජාතික ආරක්ෂක ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන බලහත්කාර ක්‍රියා මාර්ගවලට සරල ලෙස ප්‍රමුඛත්වය දීම එබඳු ප්‍රතිපත්තියක දී සිදු නොවනු ඇත.